දුරකථන
தொலைபேசி
Telephones
011-2136600
011-2136650

ලේකම්
செயலாளர்
Secretary
011-2136602

ෆැක්ස්
தொலைநகல்
Fax
011-2876169
011-2876181

විද්‍යුත් තැපැල
மின் - அஞ்சல்
E - mail
info@psc.gov.lk

වෙබ් අඩවිය
இணையத்தளம்
Website
www.psc.gov.lk


# රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්යාලය
# அரசாங்க சேவை ஆணைக்குழு அலுவலகம்
# OFFICE OF THE PUBLIC SERVICE COMMISSION


අංක 1200/9, රජමල්වත්ත පාර, බත්තරමුල්ල
இல. 1200/9, இராஜமல்வத்தை வீதி, பத்தரமுல்லை
**No. 1200/9, Rajamalwatta Road, Battaramulla**


මගේ අංකය
எனது இல.
My No.
PSC/APP/HB/01/2022

ඔබේ අංකය
உமது இல.
Your No.

දිනය
திகதி
Date

2023 සැප්තැම්බර් මස 27 වන දින

---

රාජ්‍ය සේවා කොමිෂන් සභා චක්‍රලේඛ අංක : 02/2023

සියලුම අමාත්‍යාංශ ලේකම්වරුන් හා දෙපාර්තමේන්තු ප්‍රධානීන්,

**<u>සේවාවන්ගේ/තනතුරුවල ඉහළ ශ්‍රේණිවල කාර්යක්ෂමතා කඩඉම් විභාග සඳහා පෙනී සිටීම පිණිස නිලධාරීන් සුදුසුකම් ලැබීම/සපුරාලීම</u>**

නිලධාරීන් ස්වකීය සේවාවන්ගේ/තනතුරුවල ඉහළ ශ්‍රේණියට උසස්වීම් ලැබීමට පෙර, ඉහළ ශ්‍රේණිවලට නියමිත කාර්යක්ෂමතා කඩඉම් විභාග සඳහා පෙනී සිටීමට අදාළ බලධාරීන් විසින් අවසර ලබා දෙන අවස්ථාවන් රාජ්‍ය සේවා කොමිෂන් සභාව නිරීක්ෂණය කර ඇත.

02. සේවාවන්ගේ/තනතුරුවල ශ්‍රේණිවලට අදාළ කාර්යක්ෂමතා කඩඉම් පැවැත්වීමේ අරමුණ වන්නේ හුදෙක්ම අදාළ විෂයයන් පිළිබඳ සෛද්ධාන්තික දැනුම පමණක් නොව අදාළ සේවාවන්ගේ/තනතුරුවල නිරතවීමෙන් ලබන පළපුරුද්ද තුළින් ගොඩනැගෙන ප්‍රවීණත්වය ඇගයීමට ලක්කිරීමත් සමගම අදාළ ශ්‍රේණියේ රාජකාරි ඉටු කිරීමේදී අවශ්‍යවන දැනුම, නිපුණතාවය වර්ධනය කර ගැනීමට අවකාශ සැලසීමය. එබැවින්, නිලධාරීන් ඔවුන්ගේ අදාළ සේවාවේ/තනතුරේ ශ්‍රේණියක කාර්යක්ෂමතා කඩඉමක් සඳහා පෙනී සිටීමට සුදුසුකම් සපුරා ඇතැයි සැලකිය යුත්තේ ඔවුන් එම ශ්‍රේණියට/තනතුරට උසස්වීම ලද පසුව බවට කොමිෂන් සභාව තීරණය කර ඇත.

03. එබැවින්, ඉදිරියේ දී යම් නිලධාරියෙකු තම සේවාවෙහි/තනතුරෙහි තමා දැනට සිටින ශ්‍රේණියට අදාළ කාර්යක්ෂමතා කඩඉම සඳහා පමණක් පෙනී සිටිය යුතු අතර, ඉහළ ශ්‍රේණියක කාර්යක්ෂමතා කඩඉම් සඳහා පෙනී සිටීමට බලධාරීන් විසින් අවසර ලබා දීම නොකළ යුතු බවට ද කොමිෂන් සභාව වැඩිදුරටත් තීරණය කර ඇත.

04. මෙම චක්‍රලේඛය ක්‍රියාත්මක වන දිනයට පෙර පහළ ශ්‍රේණියේ තනතුරක සේවයේ නිරතව සිටින අතරතුර ඊට ඉහළ ශ්‍රේණියේ කාර්යක්ෂමතා කඩඉමකින් කොටසක් පමණක් සම්පූර්ණ කර ඇති කවර හෝ නිලධාරියෙකු වේ නම්, එම කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණයේ ඉතිරි කොටස සඳහා පෙනී සිටීමට එම නිලධාරියාට අදාළ ඉහළ ශ්‍රේණියට උසස් කළ පසුව අවස්ථාව ලබාදීමට නිසි බලධරයා විසින් කටයුතු කල යුතු බවට ද රාජ්‍ය සේවා කොමිෂන් සභාව තීරණය කර ඇත.

05. මෙම චක්‍රලේඛය ක්‍රියාත්මක වන දිනයට පෙර ඊට ඉහළ ශ්‍රේණියේ කාර්යක්ෂමතා කඩඉම සමත්ව ඇති නිලධාරීන් අදාළ කාර්යක්ෂමතා කඩඉම සම්පූර්ණ කල නිලධාරීන් සේ සලකා කටයුතු කල හැක්කේය.

06. තවද, නිලධාරීන් සේවා පළපුරුද්ද තුළින් ලබාගන්නා දැනුම, කුසලතා හා ආකල්ප භාවිතා කරමින් ඉහළ ශ්‍රේණියක කටයුතු කිරීමේ නිපුණත්වය ඇගයීමට ලක්කිරීම පිණිස එවන් කාර්යක්ෂමතා කඩඉම්වල අන්තර්ගතය අඛන්ඩව සමාලෝචනයට ලක්කිරීම සහතික කිරීමේ අවශ්‍යතාවය පිළිබඳව සියළුම පත්වීම් බලධාරීන්ගේ, පරිපාලන බලධාරීන්ගේ සහ දෙපාර්තමේන්තු ප්‍රධානීන්ගේ අවධානය යොමු කරවීමට කොමිෂන් සභාව තීරණය කර ඇත. (මේ සඳහා විවෘත ග්‍රන්ථ පරීක්ෂණය/පරීක්ෂණ/සිද්ධි අධ්‍යයනය වැනි ඇගයුම් ක්‍රම අවශ්‍ය අවස්ථාවලදී අනුගමනය කිරීම සඳහා පවතින හැකියාව සොයා බැලිය යුතුය.)

07. මෙම චක්‍රලේඛයේ විධිවිධාන ක්‍රියාත්මක වන දිනයට පෙරාතුව කාර්යක්ෂමතා කඩඉම් සම්බන්ධව ගන්නා ලද තීරණයන්ට අගතියක් නොවන පරිදි 2024.01.01 දින සිට මෙම චක්‍රලේඛයේ විධිවිධාන ක්‍රියාත්මක වේ.

රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නියමය පරිදි,

ඩබ්ලිව්.එච්.එම්.එම්.සී.කේ. දයාරත්න

ලේකම්

රාජ්‍ය සේවා කොමිෂන් සභාව.